# පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ප්‍රචණ්ඩත්වය වළක්වමු

**විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් හා කාර්යය මණ්ඩලය සඳහා වන අත්පොත**

*පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ලිංගිකත්වය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව (SGBVC) විසින් ප්‍රකාශිතයි.*

## ලාංඡනයේ විස්තරය

මෙම කමිටුවේ අරමුණ වන විශ්ව විද්‍යාල ප්‍රජාවෙහි සියලුම සාමාජිකයන්ට ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය වෙනසකින් තොරව සේවය කිරීම, ලාංඡනයේ මැද ඇති අන්තර් සම්බන්ධිත ස්ත්‍රී - පුරුෂ සමාජභාවීය සංකේතයෙන් පිළිබිඹු වේ.

ස්ත්‍රී - පුරුෂ හස්තයන්ගෙන් සංකේතවත් වන්නේ උපකාර අවශ්‍ය අයට ආරක්ෂාව සැපයීම සඳහා වූ සංහිඳියාවයි. දෙකෙළෙවර නෙළුම් පෙති කමිටුවේ අරමුණුවල පාරිශුද්ධභාවය සංකේතවත් කරයි.

අරමුණු සාක්ෂාත් කරගැනීමේ දී දෘඪ නොවන, නම්‍යශීලී බව ඉස්මතු කිරීමට ලාංඡනයේ දෙකෙළවර වක්‍රව නිර්මාණය කර ඇති අතර, නෙළුම් පෙතිවල  ගලා යන සුමට බැවුම් එම කරුණ අවධාරණය කරයි.

සුලෝහිත වර්ණ ගැන්වූ පසුබිම ශක්තිය හා අභිලාෂය නියෝජනය කරන අතර කැපී පෙනෙන රන් වර්ණයෙන් දයානුකම්පාව, උණුසුම හා ප්‍රඥාව නියෝජනය කරයි.

නිර්මාණය : කේ. එම්. සී. ඩබ්. බී. විජේරත්න (MBBS, UOP)

## උපකුලපතිතුමාගේ පණිවිඩය

ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව විසින් සම්පාදනය කරනු ලබන මෙම අත්පොත විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන් හා කාර්යය මණ්ඩලය යන දෙපිරිසම අළලා පළ වන්නකි. එමගින් අරමුණු කරන්නේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද, එවැනි අවස්ථාවකට මුහුණ දීමට සිදු වුවහොත් කළ යුත්තේ කුමක්ද, එවැනි අවස්ථා වැළැක්වීමට උපකාරී විය හැකි වන්නේ කෙසේද යන කරුණු පිළිබඳ විශ්වවිද්‍යාලයීය ප්‍රජාව දැනුම්වත් කිරීමයි. කියවන්නන්ගේ පහසු අවබෝධය සඳහා ප්‍රශ්න හා පිළිතුරු ආකෘතිය හරහා මෙම මාතෘකාවට අදාළ විවිධ කරුණු පිළිබඳ මග පෙන්වීමක් සිදු කරනු ලැබේ. අර්ථ දැක්වීම් හා වැදගත් කරුණු පැහැදිලි කිරීම සඳහා උදාහරණ, අවස්ථා දැක්වීම් හා චිත්‍ර සටහන්ද මෙම අත්පොතෙහි අඩංගු වේ.

මෙම අත්පොත විද්‍යාර්ථීන්ගේත් කාර්යය මණ්ඩලයේත් මැදිහත්වීම හා සහයෝගය සහිතව විශ්වවිද්‍යාල පරිශ්‍රය ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙන් හා ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් තොර කලාපයක් බවට පත් කිරීමේ ප්‍රයත්නයෙහි එක් අංගයකි. මෙම අභිප්‍රාය සාක්ෂාත් කරගැනීමෙහි ලා ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව විසින් සිදුකරන ලද ප්‍රශංසනීය කැපකිරීම අගය කොට සැලකිය යුතුය. මෙම ප්‍රයත්නය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය එම්. ඩී. ලමාවංස

උපකුලපති

# පෙරවදන

ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) ලෝකය පුරාම බහුලව පැතිර පවතී. මෙය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතන ඇතුළුව සමස්ත ලාංකික සමාජය තුළද දකින්නට ලැබෙන බව පැහැදිලි කරුණකි. සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකීය සමාජයේ හා විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ ඇති අවම දැනුම්වත්භාවය නිසා මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා සාමාන්‍යකරණයට පත් වී ඇත. එමෙන්ම, මෙවැනි ක්‍රියා පිළිබඳ පැමිණිලි කිරීමට ඉදිරිපත් වන පිරිස වෙත සෙසු පිරිස දක්වන උදාසීනත්වය හා විරුද්ධත්වය හේතුවෙන් ඔවුහු එසේ පැමිණිලි කිරීම සඳහා ඉදිරියට පැමිණීමෙන් වැළකෙති. මෙම අත්පොත මගින් අරමුණු කරන්නේ;

1. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා දීම

2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ සිදු වන මෙවැනි හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියා පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම හා වැළැක්වීම සඳහා වන විශ්වවිද්‍යාලයීය ප්‍රතිපත්ති හා අතුරු ව්‍යවස්ථා මගින් පනවා ඇති විධිවිධාන පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීම හා

3. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ වන දුර්මත පළවා හැර එවැනි හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියා කිසිසේත්ම නොඉවසන සංස්කෘතියක් ඇති කිරීමයි.

# පටුන

1. වැදගත් පද නිර්වචනය 1
1.1. ලිංගභේදය යනු කුමක්ද?
1.2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු කුමක්ද?

2. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ
හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) නිර්වචනය 2
2.1. ලිංගික හිංසනය
2.2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය
2.3. ලිංගික ප්‍රචණ්ඩත්වය

3. නවක වදය මේ යටතෙහිලා සැලකිය හැකිද? 5

4. පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදු වන ඒකමතික ලිංගික
ක්‍රියා මේ යටතෙහිලා සැලකිය හැකිද? 6

5. මෙබඳු ක්‍රියාකාරකම්වලදී සෑමවිටම වින්දිතයන් ස්ත්‍රීන්
හා වරදකරුවන් පුරුෂයන් පමණක් බවට පත් වේද? 8

6. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ
හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ ඔබ
දැනුම්වත් විය යුත්තේ මන්ද? 8

7. මෙම ක්‍රියාකාරකම්වලට බලපාන හේතු මොනවාද? 9

8. මෙම හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියාවල ප්‍රතිවිපාක මොනවාද? 11

9. විශ්වවිද්‍යාලය තුළ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය 12
මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය
වැළැක්වීමේ කමිටුවේ (SGBVC) කාර්යයභාරය කුමක්ද?

10. මේ සම්බන්ධ පැමිණිලි යොමු කළ යුතු වන්නේ කාටද? 13

11. පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාර මොනවාද? 13

12. මෙම පැමිණිලි විමර්ශනය කෙරෙනුයේ කෙසේද? 14

13. පැමිණිලි සම්බන්ධ රහස්‍යභාවය සුරැකේද? 15

14. පැමිණිලිකරුවන් හා සාක්ෂිකරුවන් වෙත පළිගැනීමේ අරමුණින් කෙරෙන ප්‍රතිහිංසා පිළිබඳ කටයුතු කෙරෙනුයේ කෙසේද? 16

15. මෙවැනි හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගොදුරු වූවන්ට ලැබෙන නීතිමය හා වෛද්‍යමය සහාය කවරාකාරද? 16

16. වරදකරුවන්ට දඬුවම් පැමිණවීමට විශ්වවිද්‍යාලය සතු විනය පටිපාටිය කුමක්ද? 17

17. විශ්වවිද්‍යාලය ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයෙන් හා ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් (SGBV) තොර කිරීමට ඔබට කළ හැකි දේ මොනවාද? 18

## 1. වැදගත් පද නිර්වචනය

### 1.1. ලිංගභේදය යනු කුමක්ද?

**ලිංගභේදය** යන්නෙන් අදහස් කරන්නේ මිනිසුන් ස්ත්‍රීන් හෝ පුරුෂයන් වශයෙන් බෙදා වෙන් කරන ජීවවිද්‍යාත්මක හා කායික ලක්ෂණයි. මෙම වර්ගීකරණය ප්‍රාථමික ලිංගික අවයව මත පදනම්ව මිනිසාගේ උපතේදී සිදු වන්නකි. ස්ත්‍රී පුරුෂ යන මෙම වෙනස ඉස්මතු වීමට පසුකාලීනව වැඩිවිය පැමිණීමේදී වර්ධනය වන ද්විතීයික ලිංගික ලක්ෂණද (පියයුරු, රැවුල ආදිය වර්ධනය) හේතු වේ. එමෙන්ම, ස්ත්‍රී හා පුරුෂ යන දෙආකාරයේම ජීවවිද්‍යාත්මක ගතිලක්ෂණවල සංකලනයක් සහිතව ඉපදීම නිසා එම වර්ගීකරණ දෙකෙන් එකකට සෘජුවම අයත් නොවන යම් ප්‍රතිශතයක මිනිසුන්ද සිටින අතර, ඔවුන් "අන්තර්-ලිංගික" ගණයෙහිලා සැලකේ.

### 1.2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු කුමක්ද?

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය** යන්නෙන් අදහස් කරන්නේ යම් සංස්කෘතියක් විසින් ඉහත කී ජීවවිද්‍යාත්මක වෙනස්කම් වෙත ආරෝපණය කරනු ලබන සමාජීය අර්ථ දැක්වීම්වලටයි. මෙම අර්ථ දැක්වීම් සංස්කෘතියෙන් සංස්කෘතියටත්, සමාජයෙන් සමාජයටත් වෙනස් වේ.

මෙම අර්ථ දැක්වීම් මත පදනම්ව, ජීවවිද්‍යාත්මකව "ස්ත්‍රීන්" හා " පුරුෂයන්" වශයෙන් හඳුන්වන පිරිස, යම් සමාජයක "ගැහැනුන්" හා " පිරිමින්" සඳහා සුදුසු යැයි එම සමාජය විසින් තීරණය කරනු ලැබ ඇති ගුණාංග, හැසිරීම් හා හරපද්ධතිවලට අනුගත වෙමින් සමාජානුයෝජනය වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ මෙම අපේක්ෂණ ඔවුන් අඳින පළඳින ආකාරයේ සිට ඔවුන්ගේ බාහිර පෙනුම, චර්යාව හා සාරධර්ම දක්වා විහිදී යයි. උදාහරණයක් ලෙස, ලාංකීය සමාජයේ ස්ත්‍රියකට නම් ඇය අයත් වන සංස්කෘතික කණ්ඩායම මත පදනම්ව යම් නිශ්චිත ඇඳුම් පැළඳුම් විධියක් නියම වී තිබේ. ඒ අයුරින්ම පුරුෂයන්ට අදාළ ඇඳුම් පැළඳුම් ආදියද නියම වී තිබේ.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සෘජුවම ලිංගභේදය හා සම්බන්ධ වන බැවින් ඒ වෙත කෙරෙන මෙම ආරෝපණය ද්විමය ස්ත්‍රී-පුරුෂ සමාජභාවය

ලෙස හැඳින්වේ. එහෙත් අප මතක තබා ගත යුතු කාරණය වන්නේ, ස්වකීය ජීවවිද්‍යාත්මක ලිංගිකත්වය මත පදනම්ව ක්‍රියා නොකරන නිර්ද්වීමය ස්ත්‍රී-පුරුෂ සමාජභාවී ප්‍රජාවක්ද (non-binary gender community) සිටින බවයි. ඉන්දියාව, නේපාලය වැනි ඇතැම් සමාජ හා සංස්කෘතීන් මෙම ප්‍රජාව පිළිගන්නවා පමණක් නොව ඔවුන්ගේ අයිතිවාසිකම් පවා නීතියෙන් සහතික කර තිබේ. ඇතැම් විට මොවුන් වර්ගීකරණය කිරීම සඳහා "තෙවන සමාජභාවය" (third gender) යන ඒකගත යෙදුම භාවිත කරයි.

ලිංගභේදය විසින් සම්පත් හා බලය වෙත ප්‍රවේශ වීමේ අසමානතා හා සමාජ තත්ත්වයේ වෙනස්කම් ඇති කරනු ලබයි. බලය වෙත ප්‍රවේශ වීමේ හැකියාව ස්ත්‍රී-පුරුෂ සමාජභාවයට අමතරව වෙනත් සමාජීය වර්ගීකරණ මත පදනම්වද වෙනස් වන නමුත්, බොහෝ විට පීතෘමූලික සමාජවල පුරුෂ සමාජභාවී පිරිස වෙත ස්ත්‍රී හා තෙවන සමාජභාවී පිරිසට වඩා වැඩි බලයක් හිමි වේ.

සංස්කෘතිය හා සමාජය මත පදනම්ව, ගැහැනුකම හා පිරිමිකම යන බෙදීම විසින් ඇති කෙරෙන සමාජ අපේක්ෂණ ඔවුන් වෙත දැඩි හෝ මෘදු වශයෙන් බලපැවැත්වීමට හැකිය. මෙම අපේක්ෂණ ඉතා දැඩි වන අවස්ථාවලදී ඒවාට අනුකූල නොවන පිරිස අප්‍රසාදයට හා දෝෂාරෝපණයට පමණක් නොව, හිංසනයට හා ප්‍රචණ්ඩත්වයට පවා බඳුන් වන අවස්ථා තිබේ.

එසේ වුවද, මෙකී ලිංගික හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවී වෙනස්කම් නොසලකා සියලුදෙනාම සමාන අයිතිවාසිකම් ඇති, හිංසනයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජීවත් වීමේ අයිතිය ඇති මනුෂ්‍යයන් වන බව අප සිහියේ තබා ගත යුතුය.

## 2. SGBV නිර්වචනය

### 2.1. ලිංගික හිංසනය

ලිංගික හිංසනය යනු එකඟත්වයෙන් තොර ආක්‍රමණශීලී ලිංගික ක්‍රියාකාරකම් හෝ ලිංගික අල්ලස් ඉල්ලා සිටීම යනාදිය ඇතුළත් පුළුල් යෙදුමකි. මේවා වාචික, කායික, ඉංගිතමය (gestural), දෘශ්‍යමය,

ලේඛනමය (written) හෝ සයිබර් මාධ්‍යය යන ඕනෑම ආකාරයකින් සිදු විය හැකිය.

**කායික ලිංගික හිංසනයඃ** ස්පර්ශය, කෙනිත්තීම, රහසින් පසුපස හඹා ඒම (stalking), පීඩා කිරීම

**වාචික ලිංගික හිංසනයඃ** ලිංගිකත්වය මත පදනම් වූ විහිළු හෝ සරදම් කිරීම, ලිංගිකත්වය මත පදනම් වූ අසත්‍ය කටකතා ප්‍රචාරය කිරීම, ලිංගිකමය වශයෙන් අපහාසාත්මක වචන භාවිතය, ලිංගිකත්වය මත පදනම් වූ ඇනුම්පද කීම

**වාචික නොවන ලිංගික හිංසනයඃ** යම් පුද්ගලයකු අපහසුතාවයට පත් වන ආකාරයෙන් ඇස් කොණින් බලා සිටීම (ogling), දිව පිටතට දැමීම, තොලකට ලෙවකෑම හෝ ඇස් ඉඟිමැරීම වැනි අවිනීත ඉංගිත ප්‍රකාශ කිරීම, සියුරුහන් බෑම, යතුරු සිදුරුවලින් එබී බැලීම, රහසිගත ඉන්ද්‍රියයන් නිරාවරණය කර දැක්වීම (exhibitionism)

**දෘශ්‍යමය ලිංගික හිංසනයඃ** යම් පුද්ගලයකුගේ අනුමැතියෙන් තොරව ඔහුගේ හෝ ඇයගේ ඡායාරූප ගැනීම හෝ වීඩියෝ පටිගත කිරීම, උදාහරණයක් ලෙස පොදු වැසිකිළි හා නානකාමර තුළ වීඩියෝ කැමරා සවි කිරීම, පුද්ගලයකුගේ කැමැත්තෙන් හෝ අනුදැනුමෙන් තොරව ගන්නා ලද ඡායාරූප හෝ වීඩියෝ පට භාවිත කර අදාළ පුද්ගලයාට තර්ජනය කර බිය වැද්දීම, පෞද්ගලික ඡායාරූප හා වීඩියෝ පට ප්‍රසිද්ධ කොට බෙදා හැරීම හෝ එසේ කරන බවට තර්ජනය කිරීම

**ලේඛනමය (written) ලිංගික හිංසනයඃ** අන්‍යයන් අපකීර්තියට පත් කිරීමේ හෝ "චරිත ඝාතනය කිරීමේ" අරමුණින් යුතු නිර්නාමික ලිපි, විද්‍යුත් පණිවිඩ හෝ දැන්වීම් පත්‍රිකා බෙදා හැරීම

**සයිබර් (Cyber) මාධ්‍ය භාවිතයෙන් සිදු වන ලිංගික හිංසනයඃ** පොදු කාර්යාලයීය පරිගණක හෝ විද්‍යුත් ගිණුම් අවභාවිතය, යම් පුද්ගලයකුගේ පෞද්ගලික තොරතුරු හෝ දත්ත වෙත නීත්‍යානුකූල නොවන ලෙස ප්‍රවේශ වීම හා ඒවා බෙදා හැරීම සඳහා එම පුද්ගලයාගේ ඉලෙක්ට්‍රොනික උපකරණ වෙත අනවසරයෙන් ඇතුළු වීම, බාහිර පෙනුම මත පදනම්ව යම් පුද්ගලයකු අපහසුතාවයට පත්

කිරීම (body-shaming) හා අසත්‍ය දෑ නිර්මාණය කර බෙදා හැරීම මගින් පුද්ගලයන් ලිංගිකමය වශයෙන් අපකීර්තියට පත් කිරීමට සමාජ මාධ්‍ය යොදා ගැනීම, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා වෙනත් අයකු ලෙස හැසිරෙමින් තර්ජනය කිරීම හා බිය වැද්දීම, පළිගැනීමේ අරමුණින් වෙනත් අයකුට අයත් රහස්‍ය තොරතුරු බෙදා හැරීම

## 2.2. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය

**ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය** යනුවෙන් අදහස් කරන්නේ යම් පුද්ගලයකුගේ ජීවවිද්‍යාත්මක ලිංගිකත්වය, ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය ප්‍රකාශනය මත පදනම්ව එම පුද්ගලයා වෙත මුදාහැරෙන හිංසනකාරී ක්‍රියා වේ. මෙම ක්‍රියා ඍජුවම ලිංගික හිංසනකාරී ස්වභාවයක් නොදැරීමට ඉඩ ඇති වුවද, අදාළ පුද්ගලයාගේ සැබෑ හෝ වටහාගත් ලිංගික අනන්‍යතාවය මත පදනම්ව ඔහු හෝ ඇය අපහසුතාවයට, පීඩාවට හෝ අවමානයට ලක් කරන ක්‍රියා විය හැකිය. යම් පුද්ගලයෙකු කෙරෙහි මෙවැනි හිංසනකාරී ක්‍රියා සිදු කිරීමට තවත් අයකු අනුබල ගැන්වීමද මේ යටතේම ගැනේ. ප්‍රචණ්ඩකාරී තර්ජන, බලහත්කාරකම් හා මෙහෙයවීම්ද මීට ඇතුළත් වේ. උදාහරණ ලෙස, අවිවාහක පුරුෂයකු "සමරිසි පිරිමියෙකු" ලෙස හැඳින්වීම හෝ දරුවන් නොමැති විවාහක ස්ත්‍රියක "වඳ ගැහැනියක" ලෙස හැඳින්වීමද මේ යටතෙහිලා ගැනේ.

## 2.3. ලිංගික ප්‍රචණ්ඩත්වය

**ලිංගික ප්‍රචණ්ඩත්වය** යනුවෙන් අදහස් කරන්නේ ලිංගිකමය අඩන්තේට්ටම් කිරීම, දූෂණය කිරීම, ලිංගිකමය බලහත්කාරකම් කිරීම, පීඩා කිරීම ඇතුළු කායිකමය ලිංගික හිංසා සිදු කිරීම හා එවැනි ක්‍රියා සිදු කිරීමට උත්සාහ කිරීමයි. මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියා යම් පුද්ගලයකුගේ සැබෑ හෝ ආරෝපිත ලිංගිකමය දිශානතිය හෝ අනන්‍යතාවය මත පදනම්ව සිදු විය හැකිය. ස්වකීය සහකරුවා හෝ සහකාරිය ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් කිරීම, ව්‍යභිචාරය (incest) හා බලහත්කාරයෙන් ගබ්සාවට ලක් කිරීමද (forced abortion) මේ යටතේ ගැනේ. තර්ජනයෙන් බිය ගන්වා එවැනි ක්‍රියා කරවීම හෝ යම්

පුද්ගලයකුගේ නිදහස සීමා කිරීමද ලිංගික ප්‍රචණ්ඩත්වය යටතෙහිලා සැලකේ.

### 3. නවක වදය මේ යටතෙහිලා සැලකිය හැකිද?

ඔව්. බොහෝ අවස්ථාවලදී නවක වදය SGBV ස්වරූපය ගනී. නවක වදය යනු නවකයන් විශ්වවිද්‍යාලයට අනුගත කරවීමේ හිංසා රහිත ක්‍රමයක් සේ ඇතැමුන් සැලකුවද, එය සත්‍යයක් නොවේ.

නවක වදය යටතේ සිදු කෙරෙන ලිංගිකමය වශයෙන් හිංසාකාරී හා ප්‍රචණ්ඩකාරී ඇතැම් සාමූහික ක්‍රියා මගින් විද්‍යාර්ථීන්ට නිරුවත් වීමටත්, අසභ්‍ය ලිංගික ක්‍රියාකාරකම් රඟ දැක්වීමට හෝ ඒවා විස්තර කිරීමටත්, අසභ්‍ය වීඩියෝ පට නැරඹීමටත්, යටඇඳුම් රහිතව දේශන සඳහා සහභාගී වීමටත් බල කෙරෙන අතර, පළමු වසර විද්‍යාර්ථීන් වාචිකව හිංසනයට ලක් කෙරෙමින් අසභ්‍ය වාග් ව්‍යවහාරයක් භාවිත කිරීමද, ඔවුන්ට අසභ්‍ය කවි පාඩම් කරගැනීමට නියම කර ඔවුන් ලවා ඒවා ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් ඉදිරියේ කියවීමද සිදු කෙරේ.



ඇතැමුන්ගේ විශ්වාසය වන්නේ ලිංගභේදය මත පදනම් වූ නවක වදය සඳහා සහභාගී වන පාර්ශ්ව සමාන ලිංගිකයන් වන විට (එනම්, ජ්‍යෙෂ්ඨ පිරිමි විද්‍යාර්ථීන් පළමු වසර පිරිමි විද්‍යාර්ථීන් නවක වදයට ලක් කිරීම වැනි), එය ලිංගික හිංසනයක් හෝ ප්‍රචණ්ඩත්වයක් සේ දැක්විය නොහැකි බවයි. එහෙත් අප මතක තබා ගත යුතු කාරණය වන්නේ, හිංසනයට ගොදුරු වූවන්ගේ හෝ හිංසනය සිදු කළ අයගේ ලිංගභේදය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත ඔවුන් මුහුණ පෑ හෝ සිදු කළ හිංසනය හා ප්‍රචණ්ඩත්වය කිසිසේත්ම අවලංගු නොවන බවයි. නවක වදය යන සන්දර්භය යටතේ ඔබ කැමැත්තක්

නොදක්වන යමක් කරන ලෙස ඔබට බල කෙරුණේ නම්, එය හිංසනය හා ප්‍රචණ්ඩත්වයයි.


**4. පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදු වන ඒකමතික ලිංගික ක්‍රියා මේ යටතෙහිලා සැලකිය හැකිද?**

ඔව්. ඒවාද පහත සඳහන් අවස්ථාවලදී SGBV යටතට ගැනේ.

<u>අවස්ථාව - 1:</u> පුද්ගලයක් දෙදෙනෙකු අතර ආදර සම්බන්ධතාවයක් පැවතියද, එක් පාර්ශ්වයක් අනිත් පාර්ශ්වයේ කැමැත්තෙන් තොරව තර්ජනය හා බිය ගැන්වීම මගින් ලිංගික ක්‍රියාවල නිරත වීමට බල කරන්නේ නම් එය SGBV ගණයෙහිලා සැලකේ. උදාහරණයක් ලෙස, එක් සහකරුවකු ගර්භණීභාවයට හේතු විය හැකි අනාරක්ෂිත ලිංගික ක්‍රියාවල හෝ ලිංගික හෝ කායික වශයෙන් පීඩාකාරී වෙනත් ක්‍රියාවක හෝ නිරත වීමට අනෙකාට බල කරන්නේ නම් එය SGBV ලෙස සැලකේ.

<u>අවස්ථාව - 2:</u> යම් පුද්ගලයකට ලිංගික ක්‍රියාවල නිරත වන ලෙස තවත් අයකු විසින් තැති ගන්වනු ලැබීම නිසා හෝ එයට එකඟ නොවුණහොත් කුමක් සිදු වේද යන්න පිළිබඳ ඍජුව හෝ වක්‍රාකාරව තර්ජනය කිරීම නිසා ලිංගික ක්‍රියාවල නිරත වේ නම් එය SGBV යටතෙහිලා ගැනේ. උදාහරණයක් ලෙස, ඔබගේ අධ්‍යාපනය හෝ වෘත්තිය සම්බන්ධයෙන් අධිකාරී බලය සහිත යම් පුද්ගලයෙකු ඔබ ඒ අදාළ අංශයේ ඉහළ මට්ටමට පත් කිරීමට ලිංගික අල්ලස් ඉල්ලා සිටින්නේ නම් හෝ ඔබ එයට එකඟ නොවුණහොත් ඔබට හිමිවීමට ඇති දේ අහිමි කිරීමට පියවර ගන්නා බව විශ්වාස කිරීමට සලස්වන්නේ නම් එය SGBV යටතෙහිලා ගැනේ.

ඇතැම් අවස්ථාවලදී මෙවැනි සම්බන්ධතාවල යටත් පුද්ගලයා ස්වකැමැත්තෙන් මෙම ක්‍රියාකාරකම් සිදු කරන්නාක් මෙන් පෙනෙන්නට පුළුවන. එහෙත් මෙවැනි සිදුවීම් පිටුපස ඇති සැබෑ තත්ත්වය වන්නේ අදාළ දෙපාර්ශ්වය අතර පවතින අසමාන සම්බන්ධතාවය බව නොසලකා හැරිය නොහැකි කාරණයකි. අදාළ ක්‍රියාවට එකඟ වන පුද්ගලයා තමා විසින් එය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් ලකුණු, පන්ති සාමාර්ථය, රැකියාව, ශිෂ්‍යත්ව, උසස්වීම් හෝ වෙනත් ඕනෑම අධ්‍යාපනය හෝ රැකියාව සම්බන්ධ ප්‍රතිලාභවලට අනිසි බලපෑමක් කරාවිය යන බියෙන් එයට පෙළඹෙනවා විය හැකිය.



මෙවැනි ක්‍රියාවලීන් අධ්‍යාපනය හෝ වෘත්තීය කටයුතුවලට ආකාර දෙකකින් අනිසි ප්‍රතිඵල ගෙන දෙයිඃ අ) ඔබ ඔබට සුදුසුකමක් හෝ හිමිකමක් නොමැති යමක් බලාපොරොත්තුවෙන් ලිංගික අල්ලස් දීමට කටයුතු කරන්නේ නම්, ඒ ඔබ පැහැර ගන්නේ සුදුසුකම් සහිත සම විද්‍යාර්ථියකුට හෝ සගයකුට හිමි විය යුතු දෙයකි. ආ) ප්‍රතික්ෂේප කිරීම මගින් ඔබට හිමි විය යුතු දේ අහිමි වනු ඇතිය යන බියෙන් යම් පුද්ගලයකුට ඔබගෙන් ලිංගික ප්‍රතිලාභ ලබා ගැනීමට ඔබ ඉඩ දෙන්නේ නම්, ඒ ඔබ තවත් අයකුට උල්ලංඝනය කිරීමට ඉඩ දෙන්නේ විද්‍යාර්ථියෙකු හෝ වෘත්තිකයෙකු වශයෙන් ඔබ සතු අයිතිවාසිකම් වේ. ඔබ ඔබගේ යටත් නිලධාරියාට, නැතහොත්, විද්‍යාර්ථීයාට හෝ සේවකයාට, ඔවුන්ට අදාළ වරප්‍රසාද වෙනුවෙන් ඔබගේ ලිංගික අභිප්‍රායන් සපුරාලීමට බල කරන්නේ නම්, ඒ ඔබ සිදු කරන්නේ කිසිසේත්ම නීත්‍යානුකූල නොවන අයථා කටයුත්තක් වන අතර, ඔබ සේවය කරන විශ්වවිද්‍යාලයට අපකීර්තිය ගෙන එන්නෙකි.

මෙහිදී සිහියේ තබා ගත යුතු වැදගත් කාරණය නම්, බොහෝ ආයතන තුළ පවතින, ඉහළ තනතුරු දරන්නන්ට වැඩි බලයක් හිමි වන ධූරාවලිමය ස්වභාවය (hierarchy) මෙවැනි සිදුවීම්වලට මූලික හේතුව වන බවයි. එහෙත් එබඳු හිංසන හා ප්‍රචණ්ඩක්‍රියාවලට විරුද්ධ වීමේ අයිතිය හා විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වන අදාළ ප්‍රතිපත්තියට අනුව එබඳු ක්‍රියාවලට එරෙහිව පැමිණිලි කිරීමේ අයිතියද අප සතු බව අප මතක තබා ගත යුතුය. විශ්වවිද්‍යාලය තුළ නීත්‍යානුකූලව හිමි විය යුතු ඉඩප්‍රස්ථා හෝ සම්පත් වෙනුවෙන් ලිංගික අල්ලස් ඉල්ලා සිටීම හෝ එයට එකඟ නොවීම හේතුවෙන් යම් අයකුට තර්ජනය කිරීම හෝ දඬුවම් කිරීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිවලට එරෙහිව යාමකි.

**5. මෙබඳු ක්‍රියාකාරකම්වලදී සෑමවිටම වින්දිතයන් ස්ත්‍රීන් හා වරදකරුවන් පුරුෂයන් පමණක් බවට පත් වේද?**

නැත. කිසිසේත්ම නැත. සංඛ්‍යාදත්තවලට අනුව පුරුෂයන්ට සාපේක්ෂව ස්ත්‍රීන් වින්දිතයන් බවට පත්වීමේ වැඩි අවකාශයක් පැවතියද, ස්ත්‍රීන් හා පුරුෂයන් යන දෙපිරිසම මෙවැනි හිංසන හා ප්‍රචණ්ඩක්‍රියාවල වින්දිතයන් බවට පත්වීමේ ඉඩකඩ පවතී. එහෙත්,



බලය යනු SGBV මූලිකවම තීරණය කරන සාධකයක් නම්, එය ස්ත්‍රීන් සේම පුරුෂයන්ද එබඳු ක්‍රියාකාරකම්වල වින්දිතයන් බවට පත්වීමට හේතු සපයයි. අවාසනාවකට මෙන්, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ පවතින ගතානුගතික සම්මත විසින් හිංසන හා ප්‍රචණ්ඩක්‍රියා පිළිබඳ පැමිණිලි කිරීමට පිරිමි වින්දිතයන් ඉදිරියට පැමිණීමේ මග අහුරනු ලබයි. ලිංගික ඉංගිතය හෝ යෝජනාව නොඉල්លූ හා නොපිළිගත් එකක් වන්නේ නම්, වින්දිතයාගේ හෝ වරදකරුවාගේ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය කුමක්ද යන්න වැදගත් නොවේ.

**6. ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) පිළිබඳ ඔබ දැනුම්වත් විය යුත්තේ මන්ද?**

ඉහත සඳහන් කර ඇති ආකාරයට, SGBV විවිධාකාර වේ. SGBV වලට අදාළ විවිධ ආකාර/ක්‍රියාකාරකම් පිළිබඳ දැන සිටීම එවැනි ක්‍රියාකාරකම් හඳුනාගැනීමටත්, එවැනි ක්‍රියාකාරකමකට මුහුණ දීමට සිදු වූ විටක අවශ්‍ය උදව් උපකාර හා සහාය බලාපොරොත්තු විය යුතු වන්නේ කොතැනින්ද යන්න දැනගැනීමටත්, එවැනි අවස්ථා මග හැරීම හා වැළැක්වීම සඳහා ක්‍රියා කළ යුතු වන්නේ කෙසේදැයි

ඔබගේ සමවයස් කණ්ඩායම්වලට කියා දීමටත් උපකාරී වනු ඇත. ඔබේ අයිතිවාසිකම් පිළිබඳ අවබෝධයක් තිබීම මගින් අයුතු ප්‍රයෝජන ගැනීමෙන්, උපයෝජනයෙන්, හිංසනයෙන් හා ප්‍රචණ්ඩත්වයෙන් තොරව ජීවත් වීමට ඔබට ඇති අයිතිය වෙනුවෙන් නැගී සිටීමට අවශ්‍ය ශක්තිය හා බලය ලබා දෙනු ඇති අතර අන්‍යයන්ගේ අයිතිවාසිකම්වලට ගරු කිරීමටද ඔබ මෙහෙයවනු ඇත. මේ ආකාරයෙන් කටයුතු කළහොත් විශ්වවිද්‍යාලය සියලු දෙනාටම හිංසනයෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් තොරව ස්වකීය අධ්‍යාපනය හෝ වෘත්තිය පවත්වාගෙන යා හැකි, SGBV වලින් තොර කලාපයක් බවට පත් වනු ඇත.

## 7. මෙම ක්‍රියාකාරකම්වලට බලපාන හේතු මොනවාද?

මීට බලපාන එක් ප්‍රමුඛ හේතුවක් ඉලක්ක කොට දැක්වීම අසීරු කාරණයකි. පහත දැක්වෙන්නේ මීට බලපා ඇති හේතු අතුරින් කිහිපයකි.

**බලය (Power):** බලයේ අසමතුලිතතාවයක් හෝ ධූරාවලියක් පවතින ඕනෑම ස්ථානයක ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය සිදු වීමට ඉඩකඩ පවතී. බොහෝ විට මීට ගොදුරු වන පාර්ශ්වය බවට පත්වන්නේ අවම



බලයක් සහිත පිරිසයි. කාර්යය මණ්ඩල සාමාජිකයන් හෝ විද්‍යාර්ථීන් වේවා, ආයතනික ධූරාවලිය තුළ ඉහළින් සිටින පිරිස කිසිදු ප්‍රතිවිපාකයකින් තොරව (එනම්, දඬුවම් හෝ ප්‍රතිවිපාක පිළිබඳ කිසිදු බියකින් තොරව) අන්‍යයන් පීඩාවට පත් කිරීමේ බලය දරා සිටිති. බලය යනු මීට බලපාන ප්‍රමුඛතම හේතුව බව දැක්වෙන හොඳම උදාහරණයක් වන්නේ

ජ්‍යෙෂ්ඨ විද්‍යාර්ථීන් අතින් ස්ත්‍රී හා පුරුෂ යන දෙපාර්ශ්වයේම කනිෂ්ඨ විද්‍යාර්ථීන් පීඩාවට පත් වන නවක වදයයි.

**ලිංගිකත්වය පිළිබඳ ලජ්ජාශීලී ආකල්පයක් දරන සංස්කෘතිය (Culture of Shame) හා වින්දිතයා වෙත දෝෂාරෝපණ එල්ල වීම:** උදාහරණයක් වශයෙන්, යම් ස්ත්‍රියක් ස්ත්‍රී දූෂණය පිළිබඳ පැමිණිලි කරන අවස්ථාවක ඇතැම් පුද්ගලයෝ ඇය ඒ අවස්ථාවේ ඇඳ සිටියේ කුමක්ද, ඇය ඒ අවස්ථාවේ සිද්ධිය සිදු වූ ස්ථානයේ සිටියේ කුමක් සඳහාද යනාදී වශයෙන් ප්‍රශ්න කරති. එබැවින් බොහෝ වින්දිතයෝ නිහඬව සිටීමටත් පැමිණිලි කිරීමට ඉදිරිපත් වීමෙන් වැළකීමටත් පෙළඹෙති. වින්දිතයන්ගේ පවුල්වල සාමාජිකයන් පවා සිය සමාජ තත්ත්වයට හානි වේය යන බියෙන් හෝ වින්දිතයාගේ ගෞරවය ආරක්ෂා කිරීමේ අපේක්ෂාවෙන් හෝ පැමිණිලි කිරීම යන කාරණයේදී ඔහු හෝ ඇය වෙත දක්වන්නේ අඩු සහයෝගයකි.

**ලිංගිකමය වශයෙන් වෙනස් කොට සැලකීම (Sexual Double Standards):** සාමාන්‍යයෙන් ශ්‍රී ලාංකීය සමාජය ලිංගිකමය අවභාවිත හෝ අත්වැරදීම් සම්බන්ධයෙන් පුරුෂ පාර්ශ්වයට වඩා ස්ත්‍රී පාර්ශ්වය කෙරෙහි දැඩි හා අනුකම්පා රහිත ප්‍රතිචාරයක් දක්වයි. ලිංගිකමය චර්යා සම්බන්ධ වඩා උසස් සුපිරිසිදු පාරිශුද්ධ තත්ත්වයක් ගැහැනු ළමුන් හා කාන්තාවන් වෙතින් අපේක්ෂා කරන අතර, ලිංගික පාරිශුද්ධිය සේ නම් කර ඔවුන් වෙත නියම කර ඇති මෙම සම්මතයන් නොපිළිපැදීම මත ලජ්ජාවට හෝ දෝෂාරෝපණයට ලක් වීමට සිදු වේය යන බියෙන් බොහෝ ස්ත්‍රී වින්දිතයෝ ඉදිරියට පැමිණීමට මැළි වෙති.

**දඬුවම් නොපැමිණවීමේ සංස්කෘතිය (Culture of Impunity):** ලිංගිකත්වය ලජ්ජා විය යුතු රහස්‍ය දෙයක් ලෙස සලකන ආකල්ප හා වින්දිතයා වෙත දෝෂාරෝපණ එල්ල වීම යන කාරණා මගින් දඬුවම්වලින් මිදී සිටීමට පමණක් නොව සිය "ක්‍රියාව" පිළිබඳ පුරසාරම් කීමට හෝ තවදුරටත් වින්දිතයා පීඩාවට පත් කිරීමට පවා අපරාධකරුවන්ට ඉඩකඩ සැලසේ. ඇතැම්විට නිහඬව සිටීම වෙනුවෙන් තවදුරටත් ලිංගික අල්ලස් හෝ ප්‍රතිලාභ ඉල්ලා සිටීමටද එය මග පාදන්නක් විය හැකිය.

**සමලිංගික භීතිකාව (Homophobia/Transphobia)**: ශ්‍රී ලාංකීය සමාජයේ බොහෝ දෙනා "විරුද්ධ" ලිංගිකයන් (heterosexual) "ස්වභාවයෙන්ම" එකිනෙකාට ආකර්ෂණය විය යුතු බව හා විරුද්ධ ලිංගික විවාහය (heterosexual marriage) සහ පවුල යන අංග සමාජය ගොඩනංවන අත්‍යවශ්‍ය මූලිකාංග විය යුතු බව උපකල්පනය කරගෙන සිටින නිසා LGBTQ ප්‍රජාව (සමරිසි ස්ත්‍රීන්, සමරිසි පුරුෂයන්, ද්විලිංගික ප්‍රජාව, සංක්‍රාන්ති ලිංගික ප්‍රජාව හා වෙනත්) පිළිගැනීමට මැලි වෙති. එබැවින් මෙම ප්‍රජාව "අපගාමී" හා සුළුතර ලිංගික ප්‍රජාවක් සේ සලකා කොන් කර තිබීම හේතුවෙන් ඔවුන් ලිංගභේදය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වයට ලක් වීමේ වැඩි ප්‍රවණතාවයක් පවතී. මෙම **ලිංගිකමය** සම්මතයන් එවැනි වින්දිතයන් පැමිණිලි කිරීම සඳහා ඉදිරිපත් වීම වැළැක්වීමට බලපායි. එසේ වුවද විශ්වවිද්‍යාලය පුද්ගලයන්ගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය මත පදනම්ව ඔවුන් වෙත කෙරෙන කිසිදු ආකාරයක හිංසනයකට හෝ ප්‍රචණ්ඩත්වයකට ඉඩ ලබා නොදෙයි.

### 8. මෙම හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියාවල ප්‍රතිවිපාක මොනවාද?

- තුවාල හෝ මරණ, අනපේක්ෂිත ගැබ් ගැනීම්, අනාරක්ෂිත ගබ්සා කිරීම් හේතුවෙන් ප්‍රජනන පද්ධතියට ඇති විය හැකි හානි, සමාජ රෝග වැළඳීම් යනාදී **කායික ගැටලු**

- විශාදය, මානසික බිඳ වැටීම, ඒකාග්‍රතාවයෙන් තොර වීම (lack of concentration), ආත්ම විශ්වාසය බිඳ වැටීම, තමා වෙතම හානි පමුණුවා ගැනීම (self-harm and suicide), මනෝදෛහික ආබාධ යනාදී **මානසික සෞඛ්‍ය ගැටලු**

- සමාජීය හා පවුල් සම්බන්ධතා වෙත ඇති වන අහිතකර බලපෑම්, ආදර සම්බන්ධතා බිඳවැටීම් හෝ දික්කසාද වීම්, රැකියාව කරගෙන යෑමේ අපහසුතා යනාදී **සමාජීය ගැටලු**

- විශ්වවිද්‍යාලයට යහපත් විද්‍යාර්ථියකු හෝ වෘත්තිකයකු අහිමි වීම, විද්‍යාර්ථියා හෝ වෘත්තිකයා සිය අධ්‍යාපනයේදී හෝ රැකියාවේදී දක්වන ක්‍රියාකාරීත්වය හෝ සඵලදායීත්වය අඩු වීම, හිංසනය හා ප්‍රචණ්ඩත්වය සම්බන්ධ පුවත් මාධ්‍ය තුළ ප්‍රචාරය වීම නිසා අදාළ ආයතනය පිළිබඳ අයහපත් ප්‍රතිරූපයක් ඇති වීම යනාදී **ආයතනික ගැටලු**

**9. විශ්වවිද්‍යාලය තුළ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුවේ කාර්යයභාරය කුමක්ද?**

ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව විශ්වවිද්‍යාලය තුළ සිදු වන ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය (SGBV) වැළැක්වීම සඳහා ප්‍රතිපත්ති හා අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2018 වර්ෂයේදී පාලක මණ්ඩලය විසින් පිහිටුවන ලද්දකි. මෙම කමිටුව පහත කරුණු සම්බන්ධයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සිය සහයෝගය ලබා දේ.

- ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් තොර යහපත් අධ්‍යයන හා රැකියා වාතාවරණයක් පවත්වාගෙන යාම

- පැමිණිලි විමර්ශනය හා විසඳීම සඳහා කඩිනම් හා සාධාරණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම

- වින්දිතයන් සඳහා සුදුසු හා ප්‍රමාණවත් සහයෝගයක් ලබා දීම

- සියලුම පුද්ගලයන් ඔවුන් අතර පවතින වෙනස්කම් නොසලකා ගෞරවාන්විත ලෙස හා සමාන මනුෂ්‍යයන් ලෙස සලකන සංස්කෘතියක් විශ්වවිද්‍යාලය තුළ නිර්මාණය කිරීම හා පවත්වාගෙන යාම

**ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්ති හා අතුරු ව්‍යවස්ථා පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ SGBV වැළැක්වීම සඳහා වන කමිටුවේ වෙබ් පිටුව බලන්න.**

**10. මේ සම්බන්ධ පැමිණිලි යොමු කළ යුතු වන්නේ කාටද?**

ඔබේ පැමිණිල්ල සෘජුවම උපකුලපති වෙත යොමු කරන්න. එම පැමිණිල්ලේ පිටපතක් SGBV වැළැක්වීම පිළිබඳ කමිටුවේ සභාපති වෙත යොමු කළ යුතුය. පැමිණිලි මාර්ගගත ක්‍රමවේදය ඔස්සේද යොමු කළ හැකි අතර, පහත සබැඳිය ඔස්සේ විශ්වවිද්‍යාල වෙබ් පිටුවේ පැමිණිලි අංශය වෙත ප්‍රවේශ වීමෙන් එය යොමු කළ හැකිය. (පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෙබ් පිටුවේ පහළම දකුණු කෙළවරේ ඇති "Quick Links" වෙත ගොස්, "Complaints" වෙත යන්න. "Complaints" යටතේ ඇති "Complaints on Sexual Harassment" වෙත ගිය පසුව SGBV වැළැක්වීමේ කමිටුවේ වෙබ් පිටුවේ ඇති "Quick Complaints" වෙත ඔබ යොමු කරනු ලැබේ) https://www.pdn.ac.lk/Complaints/complaints.php

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ SGBV වැළැක්වීම පිළිබඳ අංශයටද පහත සබැඳිය ඔස්සේ පැමිණිලි ඉදිරිපත් කළ හැකිය.
https://eugc.ac.lk/complaint-portal/instruction.php

**11. පැමිණිලි ඉදිරිපත් කළ හැකි ආකාර මොනවාද?**

- මූලික පැමිණිල්ල වාචිකව හෝ ලිඛිතව ඉදිරිපත් කළ හැකි වේ. වාචික පැමිණිල්ලක් නම්, එය විමර්ශනයට පෙර ලිඛිතව භාර දිය යුතුය.

- පැමිණිලි නාමිකව හෝ නිර්නාමිකව ඉදිරිපත් කළ හැකි වේ. නිර්නාමික පැමිණිල්ලක් නම්, විමර්ශනයට පෙර පැමිණිල්ලේ සත්‍ය අසත්‍යතාවය තහවුරු කර ගනු ඇත.

**වැදගත්:** යම් නිශ්චිත කාල සීමාවක් ඇතුළතදී පැමිණිල්ල කළ යුතු යැයි නියමයක් නොමැත. පැමිණිල්ලට අදාළ සිදුවීම හා පැමිණිල්ල අතර කාල පරතරයක් පවතින අවස්ථාවකදී උපකුලපති විසින් SGBV වැළැක්වීම පිළිබඳ කමිටුවේ උපදේශනයද සහිතව සිදුවීමට අදාළ නිශ්චිත කාලරාමුව පිළිබඳ නිර්ණය කෙරෙනු ඇත.
(ප්‍රතිපත්ති මාලාවේ පිටු අංක 5 බලන්න)



**12. මෙම පැමිණිලි විමර්ශනය කෙරෙනුයේ කෙසේද?**

- පැමිණිල්ල ලැබීමෙන් අනතුරුව උපකුලපති විසින් මූලික විමර්ශන කමිටුවක් පත් කිරීමට පියවර ගනු ලැබේ.

- පැමිණිල්ල පිළිබඳ විධිමත් විමර්ශනයක් හෝ විභාගයක් අවශ්‍ය වන බවට මූලික විමර්ශන කමිටුව තීරණය කරන්නේ නම්, පාලක මණ්ඩලය විසින් විධිමත් විමර්ශන කමිටුවක් පත් කරනු ලැබේ.

- පැමිණිලිකරු කැමති නම් ප්‍රතිපත්ති මාලාවට අනුව විධිමත් සමථකරණ ක්‍රියාවලියක් සඳහා ඉඩකඩ පවතී.



(විවිධ විමර්ශන කමිටුවල භූමිකාව හා සම්මත කාර්යය පටිපාටිය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා අතුරු ව්‍යවස්ථාවේ 3.2 හා 3.4 බලන්න)

**13. පැමිණිලි සම්බන්ධ රහස්‍යභාවය සුරැකේද?**

පැමිණිලිකාර හා විත්තිකාර යන දෙපාර්ශ්වයේම අනන්‍යතාවය මෙන්ම වාර්තාගත තොරතුරුද ආරක්ෂා කිරීමට හැකි උපරිම ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබේ.

රහස්‍යභාවය උල්ලංඝනය කරන්නන්ට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් නිසි පියවර ගනු ලැබේ.

(මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ප්‍රතිපත්තියේ පිටු අංක 5 බලන්න)

**14. පැමිණිලිකරුවන් හා සාක්ෂිකරුවන් වෙත පළිගැනීමේ අරමුණින් කෙරෙන ප්‍රතිහිංසා පිළිබඳ කටයුතු කෙරෙනුයේ කෙසේද?**

පැමිණිලිකරුවන්, සාක්ෂිකරුවන් හෝ විමර්ශන කමිටු සාමාජිකයන් වෙත පළිගැනීමේ අරමුණින් කෙරෙන ප්‍රතිහිංසා හා එසේ කරන බවට කෙරෙන තර්ජන විශ්වවිද්‍යාලය විසින් බරපතල ලෙස සලකා බැලේ. එවැනි ක්‍රියාකාරකම් හෝ එයට උත්සාහ දැරීම් සඳහා වැරදිකරුවන් බවට පත් වන අයට විනය ක්‍රියාමාර්ගවලට මුහුණ දීමට සිදු වනු ඇත. යම් පුද්ගලයකු පැමිණිල්ලක් සිදු කළ වහාම ඔහු හෝ ඇය වෙත ප්‍රතිහිංසා ඇතිවීමට පවතින ඉඩකඩ අවම කිරීමටද සුදුසු අවස්ථාවලදී විශ්වවිද්‍යාලය මගින් පියවර ගනු ලැබේ.

**15. මෙවැනි හිංසන හා ප්‍රචණ්ඩ ක්‍රියාවලට ගොදුරු වූවන්ට ලැබෙන නීතිමය හා වෛද්‍යමය සහාය කවරාකාරද?**

වින්දිතයාගේ ප්‍රකාශිත කැමැත්ත මත හා වින්දිතයාට වහාම අවශ්‍ය වන්නේ කුමක්ද යන්න පිළිබඳ විශ්වවිද්‍යාලයේ තක්සේරුව මත පදනම්ව විශ්වවිද්‍යාලය විසින් ඔහු හෝ ඇය වෛද්‍යමය, මනෝ උපදේශනමය හෝ නීතිමය සහාය ලබා ගැනීම සඳහා යොමු කරනු ලැබේ.

වින්දිතයාට අවශ්‍ය වන්නේ සෞඛ්‍යය සම්බන්ධ මැදිහත්වීමක් නම්, ඔහු හෝ ඇය විශ්වවිද්‍යාලයීය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී වෙත යොමු කරන අතර, ඔහු/ඇය විසින් තවදුරටත් සුදුසු ස්ථාන වෙත වින්දිතයා යොමු කෙරෙනු ඇත. වින්දිතයා වෙත මනෝ උපදේශනය අවශ්‍ය වන අවස්ථාවකදී ඔහු හෝ ඇය සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ඇති විශ්වවිද්‍යාලයීය උපදේශන මධ්‍යස්ථානය (CaPSU) වෙත යොමු කෙරේ. පැමිණිලිකරුගේ තත්ත්වය හා/හෝ තුවාලවල ස්වභාවය නීතිමය මැදිහත්වීමක අවශ්‍යතාවය පෙන්නුම් කරන්නේ නම්, විශ්වවිද්‍යාලයේ නීති නිලධාරියා විසින් අවශ්‍ය නීතිමය සහාය ලබාගැනීම සඳහා වින්දිතයාට මග පෙන්වීම හා සහයෝගය ලබා දීම කෙරෙනු ඇත.

**සම්බන්ධ කරගන්නා ආකාරයː**

සෞඛ්‍ය මධ්‍යස්ථානය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයː

+94 81 239 2324

නීති අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයː

+94 81 239 2327/+94 81 239 2432

SGBV පිළිබඳ කමිටුවේ විද්‍යුත් ලිපිනයː

SGBHSV@pdn.ac.lk

**16. වරදකරුවන්ට දඬුවම් පැමිණවීමට විශ්වවිද්‍යාලය සතු විනය පටිපාටිය කුමක්ද?**

**වරදකරු කාර්යය මණ්ඩල සාමාජිකයකු වන අවස්ථාවකදී, විධිමත් විමර්ශන කමිටු වාර්තාවේ අනාවරණ හා නිර්දේශ මත පදනම්ව විශ්වවිද්‍යාල පාලක සභාව විසින් දඬුවම් නියම කරනු ලැබේ.** පහතින් දක්වා ඇත්තේ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ 4වන කාණ්ඩයේ XXII පරිච්ඡේදයේ දැක්වෙන ප්‍රධාන දඬුවම්වලින් කිහිපයකි.

i.වසරක් ඉක්මවූ කාලපරිච්ඡේදයක වැටුප් වර්ධක එකක් හෝ වැඩි ප්‍රමාණයක් අත්හිටුවීම, අඩු කිරීම හෝ කල් දැමීම

i.නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළදී කිසිදු උසස්වීමේ පරීක්ෂණයකට ඉදිරිපත් වීමට නුසුදුසු බවට නම් කිරීම

i.නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා උසස්වීම් කල් දැමීම

v.නිශ්චිත ශ්‍රේණි ප්‍රමාණයකින් ජ්‍යෝෂ්ඨත්වය පහත හෙළීම

v.තනතුරෙන් පහත හෙළීම

i.අසමර්ථතාවය මත විශ්‍රාම ගැන්වීම

i.සේවය අවසන් කරවීම

i.සේවයෙන් පහ කිරීම

* වැඩි විස්තර සඳහා විශ්වවිද්‍යාල අයතන සංග්‍රහයේ 4වන කාණ්ඩයේ XXII පරිච්ඡේදය බලන්න.

**වරදකරු විද්‍යාර්ථියකු වන අවස්ථාවකදී, ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 27වන කාණ්ඩයේ නියම කර ඇති පහත දැක්වෙන දඬුවම්වලින් එකක් හෝ වැඩි ප්‍රමාණයක් විනය මණ්ඩලය විසින් උපකුලපති වෙත නිර්දේශ කරනු ලැබේ.**

i. ලිඛිතව අවවාද කිරීම හෝ තදින් තරවටු කිරීම

i. විශ්වවිද්‍යාලයෙන් තාවකාලිකව නෙරපා හැරීම

i. සපයා ඇති නේවාසික පහසුකම් හා උපකාර සේවා ඉවත් කිරීම

v. මුල්‍යමය උපකාරයක්, අනුග්‍රහයක් හෝ දීමනාවක් ලැබේ නම් එය ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ තාවකාලිකව අත්හිටුවීම

v. නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළදී විශ්වවිද්‍යාලයේ කිසිදු විභාගයකට ඉදිරිපත් වීමට නුසුදුසු බවට නම් කිරීම

i. නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළදී විශ්වවිද්‍යාලයේ විභාගවල වරදකරුට අදාළ ප්‍රතිඵල නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීම

i. විශ්වවිද්‍යාලයෙන් නෙරපා හැරීම

* වැඩි විස්තර සඳහා ශිෂ්‍ය විනය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ 27වන කාණ්ඩය බලන්න.

**17. විශ්වවිද්‍යාලය ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වයෙන් තොර කිරීමට ඔබට කළ හැකි දේ මොනවාද?**

විශ්වවිද්‍යාලය සෑම පුද්ගලයකුගේම අයිතීන්ට ගරු කරන හා සෑම පුද්ගලයකුටම හිංසනයෙන් හෝ ප්‍රචණ්ඩත්වයෙන් තොරව සිය අධ්‍යාපන හෝ වෘත්තිය කරගෙන යා හැකි ස්ථානයක් බවට පත් කළ හැකි වන්නේ අප සියලුදෙනාම එක්ව කටයුතු කළහොත් පමණකි. පහත දැක්වෙන්නේ මේ සඳහා ඔබට කළ හැකි දේ කිහිපයකි.

- මේ පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා සහභාගී වන්න. එවිට ඔබට හිංසනයේ හා ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය පිළිබඳ වඩාත් අවබෝධයක් ලැබිය හැකි වනු ඇත. ඔබගේ මිතුරු ප්‍රජාව හා වෘත්තීයමය සගයන් ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය

පිළිබඳ දැනුම්වත් කිරීමටත්, ඔවුන් තුළ ලිංගභේදය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ පවතින දුර්මත පළවා හැරීමටත් උත්සාහ කරන්න.


- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති ආකාරයේ ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩ ක්‍රියා ලෙස සැලකෙන දේ සිදු වන අවස්ථාවකදී ඊට විරුද්ධ වන්න. ඔබට ඇතිවන අපහසුතාවය ඍජුව ප්‍රකාශ කරන්න.

- ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වයට ලක් වූ වින්දිතයන්ට සෑම විටකම සහාය වන්න. ඒ යටතේ ගැනෙන ක්‍රියාවලට අදාළව ඔබ සතුව ඇති තොරතුරු සැඟවීමෙන් වළකින්න. අවශ්‍ය අවස්ථාවකදී සාක්ෂිකරුවකු ලෙස ඉදිරිපත් වන්න.

- SGBV සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සම්බන්ධ මාතෘකා අළලා පර්යේෂණ කටයුතු සිදු කරන්න. ඔබගේ ශාස්ත්‍රීය හා උපාධි නිබන්ධවල කේන්ද්‍රය බවට ඒවා පත් කර ගන්න

- SGBV සම්බන්ධ මාතෘකා ඔබගේ නිර්මාණාත්මක කටයුතු සඳහා යොදාගන්න. ඒ පිළිබඳ කවි සහ ප්‍රබන්ධ ආදිය ලියන්න. නාට්‍ය රඟ දක්වන්න. සිතුවම් අඳින්න. මෙම තේමා සිත් තුළට කාවැද්දවිය හැකි වෙනත් නිර්මාණාත්මක අවස්ථා පිළිබඳ සිතා බලන්න.




හිංසනය
හිංසනය නොඉවසිම
දඬුවම් පැමිණවීම

**ස්තුතිය**

ඉංග්‍රීසි පිටපත
මහාචාර්ය කාමන් වික්‍රමගමගේ
සම්මානිත මහාචාර්ය ජයන්ති එදිරිසිංහ

සිංහල මුල්පිටපත
සම්මානිත මහාචාර්ය කමලා ලියනගේ

සිංහල පරිවර්තනය:
නයෝමි මධුපානි කෝනාර

දමිළ පරිවර්තනය:
ශෝබනා රාජේන්ද්‍රන්

චිත්‍ර සටහන් නිර්මාණය:
උදානි පරණගම

බාහිර නිමැවුම:
මහාචාර්ය රූපිකා රාජකරුණා

සමස්ත සම්බන්ධීකරණය:
මහාචාර්ය ෂාමලී අබයසේකර

මූල්‍යමය දායකත්වය:
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## මතක තබා ගන්න

ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ
හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය හේතුවෙන්
බොහෝ පුද්ගලයෝ පීඩා විඳිති.
ඇතැම්හු නිහඬවම ඒවා දරා සිටිති. ඇතැම්හු ඒ
හේතුවෙන් විශ්වවිද්‍යාලය හැර යති.
තවත් අය ඒ හේතුවෙන් තමන්ට හැකි උපරිම
දක්ෂතා දැක්වීමෙන් වැළකී පසුබටව සිටිති.
අපි හිංසනය හා ප්‍රචණ්ඩත්වය ඉවසන්නේ හෝ එයට
සමාව දෙන්නේ ඇයි?
ලිංගික හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ
හිංසනය හා ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට
අත්වැල් බැඳ ගනිමු.
එය අපගේ විශ්වවිද්‍යාලයෙන් මුලිනුපුටා දමමු.